ලංකාවේ ගුරු වෘත්තිය

ශ්‍රී ලංකාවේ පවතින සමාජ, සංස්කෘතික සහ ආර්ථික වියවුල් සහගත භාවයන් අධ්‍යාපන ක්‍රමයේ පවතින අර්බුදකාරී තත්වයන් අතර පවතින අන්‍යෝන්‍ය සම්බන්ධතාවය පැහැදිලි කරන මෙම ලිපි පෙළේ පසුගිය ලිපියෙන් සාකච්ඡා කරන ලද්දේ එවැනි පසුබිමක් යටතේ අධ්‍යාපනය ලබා ගැනීම සඳහා දූ දරුවන්ට එදිනෙදා අත් වීඳිය යුතුව තිබෙන දුක් ගැහැට පිළිබඳව ත්, ඒ අනුව අපේ රටේ දූ දරුවන්ට ළමා කාලයක් ගත කරන්නට අවස්ථාවක් නොමැති වීම පිළිබඳව ත් ය. මෙම තත්වය තුල ගුරුවරුන් සහ ගුරුවරියන් ගෙන් ඉටු කෙරෙන වැඩ කොටස සහ අද ඔවුන්ගෙන් ඉටු විය යුතුව තිබෙන වැඩ කොටස ගැනත මෙම ලිපියෙන් සාකච්ඡා කිරීමට අදහස් කරන්නෙමි.

මා මෙයට පෙර පෙන්වා දී තිබෙන අන්දමට පශ්චාත් 1948 වකවානුවේ ආණ්ඩු බලය සහ රාජ්‍ය බලය දරා සිටි ඉංග්‍රීසියෙන් අධ්‍යාපනය ලැබූ, ඉංග්‍රීසි භාෂාවෙන් සන්නිවේදනයේ යෙදුනු රදළ ඉඩම් හිමි සහ ව්‍යාපාරික පැලැන්තියේ අධිකාරය අපේ රටේ බහුතරයක් වූ සිංහල, දෙමළ සහ මුස්ලිම් ජනයා විසින් ප්‍රතික්ෂේප කරන ලදී. ඔවුන්ගෙන් බහුතරයක් දෙනා 'බලවත්' යැයි සළකණු ලැබූ අය විසින් බොහෝ විට පීඩණයට ලක් කොට කොන් කර තැබීමේ උත්සාහයන්ට ලක් වී තිබුනේය. එහෙත් රටේ පාසැල්වල බොහෝ ජන කොටස් එකිකෙනා සමඟ එකට එක් වී අධ්‍යාපනය ලබමින් සිටි අතර ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම ද නොකඩවා කෙරුනි. මෙම වකවානුවේ දී ආරම්භ කරන ලද අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වල එක් ප්‍රතිඵලයක් වූයේ රටේ පාසැල් පද්ධතිය මෙන්ම ඒවායේ ඉගෙනීම ලත් දූ දරුවන් ද තමන් කථා කළ භාෂාව අනුව, තමන් අදහසු ආගම අනුව ක්‍රම ක්‍රමයෙන් වඩ වඩාත් වෙන් කිරීමට භාජනය කිරීමයි. ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම ක්‍රමානුකූල ලෙස දුර්වල වී යාමයි.

අනෙක් අතට මෙම ප්‍රතිසංස්කරණ වල තවත් ප්‍රතිඵලයක් වූයේ අධ්‍යාපනය ලැබූ සහ ලබා ගැනීමට අවශ්‍ය වූ ශිෂ්‍ය ප්‍රජාව මහත් වේගයෙන් ප්‍රසාරණය වීම යි. රටට වඩ වඩාත් පාසැල් ද, දක්ෂ ගුරුවර ගුරුවරියන් ද, ශිෂ්‍ය ශිෂ්‍යාවන් සහ ගුරුවර ගුරුවරියන් සඳහා ද්‍රව්‍යමය සහ මූල්‍යමය පහසුකම් ද අවශ්‍ය වීම යි. එහෙත් මෙම මුළු කාල පරිච්ඡේදය පුරාම ආණ්ඩු බලය සහ රාජ්‍ය බලය දරා සිටි ඉංග්‍රීසියෙන් අධ්‍යාපනය ලද, ඉංග්‍රීසි භාෂාවෙන් සන්නිවේදනයේ යෙදුනු සිංහල, දෙමළ සහ මුස්ලිම් ජාතීන්ට අයත් රදළ ඉඩම් හිමි සහ ව්‍යාපාරික පැලැන්තියේ අධිකාරය නොනැසෙන ආකාරයෙන් පවත්වා ගෙන යෑම සඳහා ඔවුන්ගේ දූ දරුවන් වෙනුවෙන් ඉංග්‍රීසි භාෂාවෙන් ම ඉගැන්වීමේ කටයුතු කරන්නට කැප වුනු පාසැල්, දක්ෂ ගුරුවර ගුරුවරියන් සහ ඒ සඳහා අවශ්‍ය ද්‍රව්‍යමය සහ මූල්‍යමය පහසුකම් සැපයීම ද ඒ සමඟම නොකඩවා කෙරී ගෙන ගියේය.

ජාතිකවාදී ප්‍රවණතාවයන්ගෙ අවශ්‍යතාවයන්ට අවනත වෙමින් සිංහල සහ දෙමළ භාෂාවන්ගෙන් අධ්‍යාපනය ලබා දුන් පාසැල් ප්‍රමාණය ප්‍රසාරණය කරන්නට මැතිවරණ ආසණ පුරා ප්‍රාථමික සහ මහා විද්‍යාල ද, දිස්ත්‍රික්කයකට එකක් බැගින් මධ්‍ය මහා විද්‍යාල ද පිහිටුවන ලදී. මේ පාසැල්වලට අවශ්‍ය කරන ගුරුවර ගුරුවරියන් සපයා ගැනීමට වුවමනාවක් හෝ ඒ සඳහා සැලැස්මක් හෝ වැඩ පිළිවෙලක් හෝ තිබුනේ නැත. ඒ වන විට දේශීය හෝ විදේශීය විශ්ව විද්‍යාල වලින් සමත් වුනු එහෙත් සිංහල සහ දෙමළ භාෂාවෙන් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට උගැන්වීමෙහි සමත් උපාධිධාරීන් සංඛ්‍යාව ද ඉතාමත් සීමාසහිත වීය. මෙම උපාධිධාරීන් විසින් සිදු කරන ලද සේවයේ ප්‍රතිඵලයක් වශයෙන් ලංකාවේ විශ්ව විද්‍යාල වලින් මෙම වකවානුව පුරාම සැලකිය යුතු ශිෂ්‍ය සංඛ්‍යාවක් වෛද්‍ය, දන්ත සහ පශු වෛද්‍ය, ඉංජිනේරු සහ කෘෂිකර්ම වැනි උපාධි ලබා ගත් බවත්, ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් රටේ සහ ජනතාවගේ අවශ්‍යතාවයන් ඉටු කිරීමට තිබෙන පහසුකම් සහ ලැබෙන අවස්ථාවන් වල පිරල භාවය නිසා හෝ තමන්ගේ පුද්ගලික සමාජ ආර්ථික අවශ්‍යතාවයන් නිසා හෝ විදේශගතව සිටින බවත් අපට අමතක කළ හැකි නොවේ.

මේ ආකාරයට අපේ රටේ පාසැල් සහ අධ්‍යාපන ක්‍රමය ප්‍රසාරණය වීමේ එක් ප්‍රතිඵලයක් වූයේ රට සරිලන ආකාරයේ ගුරුවර ගුරුවරියන් සඳහා පැවතුන ඉල්ලුම විශාල වශයෙන් ඉහළ යෑමයි. මෙම ඉල්ලුම සපුරන්නට තරම් විෂය දක්ෂතාවයෙන් යුතු හෝ උගැන්වීමේ දක්ෂතාවයෙන් යුතු ගුරුවර ගුරුවරියන් සැපයුමක් නොවීය. මෙම ඉල්ලුම සපුරා ලූයේ උපාධි ධාරීන් නොවූ, නොපුහුණු පුද්ගලයන් ගුරුවරුන් වශයෙන් සේවයට බඳවා ගැනීම මගිනි. 1950 ගණන් වල අග භාගයේ සහ 1960 ගණන් වල මුල් භාගයේ ගණිතය සහ ඉංග්‍රීසි ඉගැන්වීම සඳහා ගුරුවර ගුරුවරියන් වශයෙන් අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ සමත් පුද්ගලයන් දේශපාලනඥයන්ගේ උවමනා එපාකම් අනුව "ශිෂ්‍ය ගුරුවර ගුරුවරියන්" ලෙස පත් කර ගන්නා ලද ආකාරය අපට අමතක කළ නොහැකිය.

1981 දී මේ පිළිබඳව පළ කරන ලද වාර්තාවකට අනුව ඒ වකවානුවේ ලංකාවේ පාසැල් පද්ධතියේ ගුරුවර ගුරුවරියන් 140,000 ක් සිටි අතර එයින් 35,000 ක් ම නුපුහුණු අය වූහ. 1981 වෙන කෙක් ගුරු පුහුණුව සඳහා ඇතුල් වුන අය සඳහා අවම සුදුසුකම වූයේ අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී විෂයයන් හතරකින් සමත්වී සිටීම යි. 1981 න් පසු මෙම තත්වය වෙනස් වූ අතර ගුරු පුහුණුව සඳහා ඇතුල් වුන අයගේ අවම සුදුසුකම වූයේ අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී විෂයයන් හයකිනුත් අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයේ දී විෂයයන් තුනකිනුත් සාමාර්ථය ලබා සිටීම යි. අනාගතයේ දී ගුරුවරුන් වෙනුවට බලාපොරොත්තු වෙන අය ගුරු පුහුණු විද්‍යාලයකට ඇතුළු වීම සඳහා සුදුසු ලෙස සලකන්නට පෙර සාමාන්‍යයෙන් පාසැලක වසර දෙකක වත් පරිවාස කාලයක් ගත කළ යුතු වීය.

සේවයට බඳවා ගෙන සිටින ගුරුවර ගුරුවරියන් සේවයේ නිරත වන්නට පෙර පුහුණු කිරීම සඳහා මෙන්ම අධ්‍යාපන ක්‍රමයේ පවතින අක්‍රමවත් භාවයන් තුරන් කිරීම ද අරමුණු කොට ගෙන 1985 දී ජාතික අධ්‍යාපන ආයතනය (National Institute of Education) පිහිටුවා ලන ලදී. දැන් මෙම ආයතනයට අනුබද්ධව පිහිටුවා තිබෙන ගුරු අධ්‍යාපන පාලය අඩු තරමින් විශ්ව විද්‍යාල පීඨ හතරකින් ද, අධ්‍යාපන විද්‍යාල 17 කින් ද, ගුරු අධ්‍යාපන ආයතන හතරකින් ද, ගුරු මධ්‍යස්ථාන 100 යකින් ද, ප්‍රාදේශීය ඉංග්‍රීසි සහාය මධ්‍යස්ථාන 30 කින් ද සමන්විත වෙයි. මෙම ගුරු



අධ්‍යාපන පරිපාලනයට දේශපාලන පත්වීම් 600ක්

2009-10-24 | 12.20 PM

ලංකා ගුරුසේවා සංගමය
இலங்கை ஆசிரியர் சேவை சங்கம்
Ceylon Teachers Service Union

දැනට අධ්‍යාපන පරිපාලන සේවයේ වැඩ බලන පත්වීම් දරන එම තනතුරු සඳහා සුදුසුකම් නොමැති දේශපාලන පත්වීම්ධාරීන් 600කට අධ්‍යාපන පරිපාලන සේවයේ ස්ථිර තනතුරු ලබාදීම සඳහා අධ්‍යාපන අමාත්‍යංශය හැඹිරීමේ පනිවිඩයක් සකස් කරමින් සිටින බව දැනගා ගුරු සංගමය චෝදනා කරයි.

අධ්‍යාපන පරිපාලන සේවයේ ශ්‍රේණි පත්තියේ පුරප්පාඩු සියල්ල විවෘත කා සීමිත කරන විභාගවලින් සහ පෙනේයත්වය හා කුසලතා මත පදනම්ව පසුගිය දිනවල පත්වීම් ලබා දුන් බව සඳහන් කරන ලදගා ගුරු සංගමය චෝස් තිබියදී අධ් සේවක පදනම මත මෙම පත්වීම් ලබාදීමට යත්න බව අවධාරණය කරයි.

එමගේම දැනට පත්වීම් ලබා දී ඇති අධ්‍යාපන පාරිපාලන සේවයේ නිලධාරීන් පළාත් අධ්‍යාපන අමාත්‍යංශවලින් මේ වන තෙක් රාජකාරි ස්ථාන ලබාදී නැති බව සඳහන් කරන ලදගා ගුරු සංගමය දේශපාලන පත්වීම්ධාරීන් එම තනතුරුවල තවදුරටත් තබාගැනීම සඳහා ඉදිරිපත් කිරීමට රියමිත හැඹිරීමට පනිවිඩ පැමිණෙන තෙක් එම පමා කිරීම් සිදු කරන බව අවධාරණය කරයි.

මේ සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යංශයේ ලේකම් තිමේල් බණ්ඩාර මහතාගෙන් විමසීමේදී ප්‍රකාශ කලේ දිවිය කාලයක් එම පත්වීම් දරන පුද්ගලයන් ඔවුන්ට තනතුරුවල ස්ථිර කරන ලෙස ඉල්ලීමේ තර ඇති බවත්, ඒ සම්බන්ධයෙන් වූ යෝජනාවක් හැඹිරීමේ මෙහෙයුම ඉදිරිපත් කිරීමට කටයුතු සිදු කෙරෙමින් පවතින බවත්, ඒ සඳහා අනුමැතිය ලැබෙන්ද යන්න තිව නොතැකි බවත්ය.

- රාවය

අධ්‍යාපන ජාලය තුලින් බලාපොරොත්තු වූයේ දැනට සිටින ගුරුවරුන් ට සහ අනාගතයේ දී ගුරුවරුන් වෙන්නට බලාපොරොත්තු වෙන අය ට අධ්‍යාපන ක්ෂේත්‍රයේ සුදුසුකම් ලබා ගැනීම සඳහා අවස්ථාවන් සපයා දෙමින් ඔවුන්ගේ වත්මන් සහ අනාගත අවශ්‍යතාවයන් සපුරා ලීම යි.

එහෙත් සේවයේ යෙදී සිටි ගුරුවර ගුරුවරියන් අකාලයේ විශ්‍රාම යැවීමට 1990 දී ගන්නා ලද තීරණයකට අනුව යලිත් ගුරු හිඟයකට මුහුණ දෙන්නට සිදු වීය. මෙම හිඟය පියවීම සඳහා අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයේ විෂයයන් තුනකින් වත් සමත්වී නැති 50,000 ක් ගුරු වෘත්තියට බඳවා ගැනීමට සිදු වීය. මෙවැනි ආකාරයකට, වතුකරයේ පාසැල්වල ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ඉගැන්වීම සඳහා අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ සමත් අය 1,000 ක් දෙනා ගුරු වෘත්තියට බඳවා ගැනීම සිදු වීය. 1997 දී මෙම සුදුසුකම නැවතත් අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය දක්වා ඉහළ නංවන ලදී.

මෙවැනි වෙනස්කම් ගණනාවකට භාජනය වීමෙන් පසු ඇතැම් විෂය අංශ අතින් වත් සම්පූර්ණ සුදුසුකම් ලබා ඇති ගුරුවරුන්ගෙන් අපේ රට පිරී ඉතිරි ගොස් තිබීය යුතු වීය. එහෙත් අපේ රටේ දූ දරුවන් විසින් අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී අත් කර ගන්නා ලද ප්‍රතිඵල පිළිබඳව පසුගිය ලිපිය සමඟ පළ කරන ලද පුවත්පත් වාර්තාවට අනුව නම් එවැනි තත්වයක් රටේ තවමත් ඇති වී නොමැති බව පෙනෙයි.

අපේ රටේ ගුරුවර ගුරුවරියන්ගේ රාජකාරිය වී තිබෙන්නේ විෂය නිර්දේශය (syllabus) ආවරණය කිරීම පමණකි. සමස්ථ යක් ලෙස ගත් විට දූ දරුවන් වර්ධනය කිරීම ගැන ඔවුහු සැලකිල්ලක් නොදක්වති. එසේ වර්ධනය කිරීම තවදුරටත් පාසැලේ හෝ අධ්‍යාපනයේ වගකීමක් ලෙස නොසැලකේ. දූ දරුවන්ට උපදෙස් දීම, ඔවුන් පූරාදු පුහුණු කිරීම සහ හැසිරවීම අතින් ගත් විට ගුරුවර ගුරුවරියන් දුර්වල තත්වයකට පත්ව සිටිති. ලංකාවේ ගුරුවර ගුරුවරියන් ඕස්ට්‍රේලියාවේ මෙන් වෘත්තීමය වශයෙන් පුහුණුවක් ලද්දන් නොවේ. ගුරුවර ගුරුවරියන්ගේ වැඩ කටයුතු අධීක්ෂණය කිරීම, සංවර්ධනය කිරීම සහ පරිපාලනය කිරීම සඳහා සකස් වූ නියාමක ආයතනයක් (regulatory body) ලංකාවේ ක්‍රියාත්මක නොවේ. විෂය සීමාවෙන් පරිබාහිරව දූ දරුවන්ගේ අධ්‍යාපන හා මානසික වර්ධනය ඇති කිරීම සඳහා අවශ්‍ය කරන ක්‍රම වේදයන් පිළිබඳ පරිපූරක දක්ෂතාවයන් සහ කුසලතාවයන් ගුරුවර ගුරුවරියන්ට ලබා දීමට යාන්ත්‍රනයක් හෝ වැඩ පිළිවෙලක් අද පවා නොමැති වීම කණගාටුවට කරුණකි.

අපේ රටේ ගුරුවර ශිෂ්‍ය අනුපාතය එකට දහ අටකි. මේ අතින් අපි ලෝකයේ බොහෝ ඉදිරියෙන් සිටින රටවලින් එකකි. එහෙත් බොහෝ සාමාන්‍ය පාසැල්වල එක පංතියක ශිෂ්‍ය ශිෂ්‍යාවන් පණහක් පමණ සිටිති. පොදුවේ ගත් විට මෙම පාසැල්වල ගුරුවර ශිෂ්‍ය අනුපාතය එකට තිහත් හතළිහත් අතර වෙයි. මෙයට හේතුව එක්කෝ කාල සටහනකට අනුව සේවා කටයුතු නොපවරනු ලබන අතිරික්ත ගුරුවර ගුරුවරියන් එම පාසැල්වල සිටීම නිසා හෝ පාසැලෙන් වැටුප් හා දීමනා ලබන අතර දේශපාලන පදවි ලබා දී සේවාස්ථ උපදේශකයන් (In-Service Advisers) ලෙස වෙනත් ස්ථානවල සේවයේ යෙදවීම නිසා හෝ විය හැකිය.

විශේෂයෙන් ම සාමාන්‍ය පාසැල්වල ගුරු අතිරික්තය සමන්විත වන්නේ පරිපාලකයන්, ආරක්ෂක නිලධාරීන්, වෛද්‍යවරුන් වැනි අයගේ බිරිඳන්දාවරුන්ගෙන් යයි පැවසේ. විද්‍යා, ගණිත සහ ඉංග්‍රීසි වැනි විෂයයන් ඉගැන්වීමට අවශ්‍ය කරන තරමේ ගුරුවර ගුරුවරියන් ඇතැම් පාසැල්වල නොමැති තරම් ය. ඉහත කී බිරිඳන්දාවරුන් දැනට සිටින පාසැලකින් වෙනත් පාසැලකට මාරුවක් ලබා දීම කළ නොහැක්ක ක් ලෙස සැලකේ. මීට හේතුව ඔවුන් සිය ස්වාමි පුරුෂයන් ගේ බලතල ද දරා සිටින රැජිණියන් ලෙස සැලකෙන හෙයිනි.

ප්‍රශ්ණය අපට අවශ්‍ය තරම් ගුරුවර ගුරුවරියන් නොමැති කම නොවේ. ඇත්තේ දේශපාලන බලපෑම් හේතුවෙන් එම ගුරුවර ගුරුවරියන් නිසි ලෙස සේවයේ යෙදවීමට සහ නියාමණය (regulate) කිරීමට නොහැකි වීම යි. මෙහි පළ කොට තිබෙන ජායාරූපයෙන් දැක්වෙන්නේ මෙම කරුණම නොවේ ද?

මෙම ශොචනීය තත්වයට බල පා තිබෙන පසුබිම පිළිබඳව මීළඟ ලිපියෙන් තවදුරටත් සාකච්ඡා කරමු.

ලයනල් බෝපගේ